# විශ්‍රාමික නිලධාරී/ සෙසුනිලයින්ගේ
# නිල ඇඳුම් රෙගුලාසි මාලාව

# පටුන

හැඳින්වීම.

නිල ඇඳුම් පැළඳීම සඳහා අවසරලත් විශ්‍රාමික හමුදා සමාජිකයින්.

අවසරලත් අවස්ථාවන්.

අවසර නොලත් විශ්‍රාමික හමුදා සාමාජිකයින් සහ අවස්ථාවන්.

විශ්‍රාමික හමුදා සාමාජිකයින් හට පැළඳීමට අවසරලත් ඇඳුම්.



## හැඳින්වීම

1. තම වෘත්තීමය ක්ෂේත්‍රයන්හි මනා පරිචයක් ලද විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් යුධ විරුවන් ලෙස හඳුන්වනු ලබයි. ඒ අනුව ක්‍රියාන්විතයන් හි හෝ සක්‍රීය සේවයේ යෙදී සිට ඉහළම නිලයන්ට ළඟාවූ සහ ගෞරවණීය හෝ පිළිගත හැකි තත්ත්වයන් මත හමුදා සේවයෙන් ඉවත් වූ ශ්‍රී ලංකා සන්නද්ධ සේවාවන්හි (යුධ, නාවික හා ගුවන් හමුදාවන් හි) සේවයේ නියුතුව සිටි සාමාජිකයන් යුධ ප්‍රවීණයන් ලෙස සලකනු ලබයි. විශේෂ අවශ්‍යතාවයන් සඳහා විධායක නියෝගයක් මඟින් සක්‍රීය සේවයට කැඳවුම් ලැබූවන් ද මෙම කාණ්ඩයට අයත් වේ. මෙම තත්ත්වයන් යටතේ විශ්‍රාම ගැන්වීමෙන් පසුව නිල ඇඳුමක් පැළඳීම ඔවුන් රට වෙනුවෙන් දක්වන ලද පක්ෂපාතීත්වය සඳහා හිමිගන්වනු ලබන වරප්‍රසාදයක් ලෙස දැක්විය හැකිය.

2. විශ්‍රාමික හමුදා සාමාජිකයන්ගේ සංගමයෙහි (ආරක්ෂක අමාත්‍යාංශයෙහි ලියාපදිංචි එකම සංගමය) සාමාජිකත්වය ලබා ඇති ත්‍රිවිධ හමුදා විශ්‍රාමික සාමාජිකයින් හට පහත සඳහන් නීතිරීතීන්ට අනුකූලව මෙහි මතු දැක්වෙන නිල ඇඳුම් ජාතික උත්සව /ත්‍රිවිධ හමුදා සහ හමුදා නොවන උත්සව අවස්ථාවන් හිදී පැළඳිය හැකිය.



## නිල ඇඳුම් පැළඳීම සඳහා අවසරලත් විශ්‍රාමික හමුදා සාමාජිකයින්

3. පහත දක්වා ඇති ත්‍රිවිධ හමුදාවන් හි සේවය කර විශ්‍රාම ලද නිලධාරීන් සහ සෙසුනිලයින් හට නිල ඇඳුම්/ආයිත්තම් පැළඳිය හැකි වේ.

අ. විශ්‍රාමික ත්‍රිවිධ හමුදාධිපතිවරුන්.

ආ. විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්.

ඇ. නිත්‍ය හා ස්වේච්ඡා බලසේනාවේ සිට විශ්‍රාම ලබා නැවත සේවයට කැඳවා ඇති, ත්‍රිවිධ හමුදා හෝ සිවිල් ආයතනයන් හි සේවයේ නියුතු විශ්‍රාමික හමුදා සමාජිකයින්.

ඈ. ආබාධිත ත්‍රිවිධ හමුදා විශ්‍රාමිකයින්.

ඉ. සේවා විශ්‍රාමික වැටුප් ලබන හමුදා නිලධාරීන් හෝ සෙසුනිලයන්.

ඊ. අවුරුදු 10/12 ක සේවයෙන් පසුව ගෞරවාන්විත විශ්‍රාම ගැන්වීමක් ලැබූ නිලධාරීන් සහ සෙසුනිලයන්.

උ. වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ලැබූ නිලධාරීන් සහ සෙසුනිලයන් (අවම වශයෙන් වසර 10/12 ක් හෝ සම්පූර්ණ කිරීමෙන් පසු වෛද්‍ය හේතූන් මත සක්‍රීය සේවයෙන් විශ්‍රාම ගැන්වූ නිලධාරීන් හා සෙසුනිලයන් පමණක්).

ඌ. විදෙස්ගතව සිටින නිලධාරීන් හෝ සෙසුනිලයන් සහ රාජ්‍යතාන්ත්‍රික මෙහෙයුම්හි නියුතු වූවන්.



ඵ. මියගිය විශ්‍රාමික හමුදා සාමාජිකයින්ගේ ළඟම ඥාතියා (ජාතික ඇඳුම/සාරිය, යුරෝපීය ඇඳුම සමඟ අනුමත පදක්කම් පමණක් පැළඳිය හැක).



## නිල ඇඳුම් පැළඳීමට අවසරලත් අවස්ථාවන්

4. විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හට නිල ඇඳුම් පැළඳීම සඳහා රජයේ ආයතනයකින්/ත්‍රිවිධ හමුදාවෙන් සහ සිවිල් ආයතනයකින් ආරාධනා කර ඇති විටක දී පමණි (විශ්‍රාමික හැඳුනුම්පත ලග තබාගත යුතුය).

අ. ජාතික හෝ රාජ්‍ය උත්සව අවස්ථාවන්:

(1) ජාතික නිදහස් දිනය.

(2) යුධ සැමරුම් දිනය.

(3) ජාතික යුධ අනුස්මරණ දිනය.

(4) සන්නද්ධ හමුදා ස්මරණ දිනය.

(5) රාජාසන කථාව/පළමු පාර්ලිමේන්තු සැසි වාරය.

(6) රාජ්‍ය භෝජන සංග්‍රහයන්.

(7) රාජ්‍යතාන්ත්‍රික මෙහෙයුම් හෝ රාජ්‍යතාන්ත්‍රික හමුවීම්.

(8) රාජ්‍ය අවමංගල්‍යය උත්සව.



ආ. ත්‍රිවිධ හමුදා උත්සව අවස්ථාවන්:

(1) ත්‍රිවිධ හමුදා සංවත්සර/ අනුස්මරණ දින.

(2) විසිරයාමේ පෙළපාලි/උපාධි ප්‍රදානෝත්සව.

(3) වර්ණ ප්‍රදානය සහ වර්ණ නැවත හිමිගැන්වීම.

(4) නිල රාත්‍රී භෝජන සංග්‍රහයන්/රාත්‍රී භෝජන සංග්‍රහයන්.

(5) හමුදා මංගල උත්සව/අවමංගල්‍යය උත්සව.

ඇ. සිවිල් ආයතනයන් විසින් සංවිධානය කරනු ලබන යුද්ධ හමුදා නොවන උත්සව අවස්ථාවන්:

(1) දේශමාමක පෙළපාලි (රජය විසින් සංවිධානය කරනු ලබන).

(2) විශ්‍රාමික හමුදා සාමාජිකයන් හට ගෞරව පුදකිරීම සඳහා සංවිධානය කරනු ලබන සමාජීය උත්සව අවස්ථාවන්.

(3) පාසැල් උත්සව අවස්ථාවන්/සමාරම්භක උත්සව (පාසැල් ශිෂ්‍යභට/ශිෂ්‍ය නායක දින ගෞරව පුද කිරීමේ උත්සවයන් ඇතුළුව).



## අවසර නොලත් අවස්ථාවන් සහ පුද්ගලයන්

5. විශ්‍රාමලත් සහ සේවයෙන් ඉවත් කරන ලද ත්‍රිවිධ හමුදා සමාජිකයින් හට පහත දැක්වෙන ස්ථානයන්හි දී හා අවස්ථාවන්හි දී නිල ඇඳුම් පැළඳීම තහනම් කර ඇත.

අ. රාජ්‍ය විරෝධී රැස්වීම් හෝ විරෝධතාවයන්හි දී.

ආ. දේශපාලන රැස්වීම් හිදී නිල ඇඳුම දර්ශනය හෝ ප්‍රදර්ශනය වන පරිදි ප්‍රදර්ශන පුවරු/මහජන දැන්වීම්/සමාජ මධ්‍ය තුළින් ප්‍රදර්ශනය කිරීම.

ඇ. පෞද්ගලික රැකියා හෝ මුල්‍යමය අපේක්ෂාවන් උදෙසා සංවිධානය කරනු ලබන උත්සව.

ඈ. සිවිල් හෝ අපරාධ උසාවියක පෙනී සිටීම.

ඉ. මහජන ඇමතීමක දී, සම්මුඛ පරීක්ෂණයක දී, විරෝධතාවයක දී, පා ගමනක දී, රැලියක දී, වෙනත් යුද්ධ හමුදා සහයෝගයක් සහ නියෝජනය කිරීමක් සේ හැඟෙන පරිද්දෙන් දැක්වෙන මහජන ප්‍රදර්ශන අවස්ථාවල දී.

ඊ. දේශපාලනික ක්‍රියාකාරකම්, පෞද්ගලික කටයුතු හෝ මුල්‍යමය අරමුණු උදෙසා.

උ. රාජකාරියෙන් බැහැරව සිටින අවස්ථාවන්හි දී.

ඌ. සිවිල් ආයතනයන් හි හෝ පුද්ගලික ආරක්ෂක සේවාවන් හි සේවයේ නියුතු වීමේදී.



## විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හට අවසරලත් නිල ඇඳුම්

6. විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයන් සඳහා වූ නිල ඇඳුම් පහත පරිදි වේ.

අ. විශ්‍රාමික හමුදා සාමාජිකයන් (පිරිමි) - ඇමුණුම "අ".
ආ. විශ්‍රාමික හමුදා සාමාජිකයන් (කාන්තා) - ඇමුණුම "ආ".

7. නිලයන් හා සේවාවන් අනුව සිරස්ක ලාංඡනය:

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව



මේජර් ජෙනරාල් සහ ඉන් ඉහළ නිලයන්



බ්‍රිගේඩියර් සහ කර්නල් නිලයන්



ලුතිතන් කර්නල් සහ ඉන් පහළ (රෙජිමේන්තු වලට ආවේනික)



## ශ්‍රී ලංකා නාවික හමුදාව



රියර් අද්මිරාල් සහ ඉහළ නිලයන්



කොමදෝරු නිලය



කපිතන් සහ පහල නිලයන්

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව



තරු එක සහ ඉන් ඉහළ නිලයන්



තරු එක නිලයෙන් පහළ නිලයන්




සෙසුනිල



ඇමුණුම "අ"

## විශ්‍රාමික හමුදා සාමාජිකයන් සඳහා වූ නිල ඇඳුම - පිරිමි (නිලධාරීන් සහ සෙසුනිලයන්)



| අනු අංකය | අයිතමය | විස්තරය | විශේෂ කරුණු |
|---|---|---|---|
| 01 | කමිසය | සුදු අත් දිග | |
| 02 | කබාය/සිවිල් කබාය | කළු/තද නිල් | |
| 03 | කලිසම | කළු/අළු | |
| 04 | හිස් පළඳනාව | සේවාවන්ට ආවේනික හිස් වැසුම | **යුද්ධ හමුදාව:** කර්නල් සහ ඉන් ඉහළ එම්බ්‍රොයිඩර් සහ ලුතිනන් කර්නල් සහ ඉන් පහළ නිලයන් සඳහා රෙපිමේන්තුවට ආවේනික සිරස්ක ලාංඡනය.<br>**නාවික හමුදාව:** ආවේනික සිරස්ක ලාංඡනය සමග කළු/නිල් වර්ණයෙන් යුත් හිස් වැසුම් පැළඳිම.<br>**ගුවන් හමුදාව:** ආවේනික සිරස්ක ලාංඡනය සමග හිස් වැසුම් පැළඳීම. |
| 05 | කර පටිය/ බෝ (Tie/ Bow) | සේවාවන්ට අදාළ කර පටිය | අ. සේවාවන්ට අදාළ කර පටිය සුදුසු පරිදි පැළඳිම.<br>ආ. අවමංගල්‍යය උත්සව අවස්ථාවන් සඳහා කළු වර්ණයන්ගෙන් යුත් කර පටිය/බෝ (Tie/ Bow). |
| 06 | සපත්තු | ලේස් සහිත සපත්තු (ඔප දමන ලද) | කලිසමට සුදුසු වන කළු/දුඹුරු වර්ණයන්ගෙන්. |
| 07 | මේස් | සුදුසු පරිදි | කළු කලිසම සඳහා කළු වර්ණයෙන් යුත් මේස් ද අළු කලිසම් සඳහා අළු වර්ණයෙන් යුතු මේස් ද පැළඳිය යුතු වේ. |




| | | | |
|---|---|---|---|
| 08 | බඳ පටිය | සුදුසු පරිදි | කළු/දුඹුරු වර්ණයන්ගෙන් |
| 09 | තරු | සේවාවන්ට අවේනික රත්‍රං/ රිදී පැහැති වර්ණයෙන් යුත් තරු (තරුවක උස 1.5 සෙ.මි පළල 1.5 සෙ.මි.) | ත්‍රිවිධ හමුදා ධජ නිලධාරීන් (Tri Service Ranks Brigadier and above) කබාය/සිවිල්කබා යෙහි වම්පස (Lapel) මත. |
| 10 | පදක්කම් | අනුමත පදක්කම් (පපුවෙහි වම් පස) | පදක්කම් හිමි විශ්‍රාමික නිලධාරි /සෙසුනිලයකු මියයාමෙන් පසුව ඔහුට හිමි ගන්වා ඇති පදක්කම් ඔහුගේ ළගම ඥාතියා/දරුවන් හට පපුවේ වම් පස පැළදීමට හැකියාව ඇත (දැනට සේවයේ නියතු වුවන් හට මෙයට හිමිකම් නොමැත). |
| 11 | ලාංඡන | අනුමත සහ සුදුසුකම් ලද ලාංඡන | කබාය සඳහා පමණක් දකුණුපස (Lapel) මත අඳාළ සේවාවන් හි ජෙෂ්ඨතාවය අනුව ලාංඡන පැළඳිය යුතුය. |



ඇමුණුම "ආ"

# විශ්‍රාමික හමුදා සාමාජිකයන් සඳහා වූ නිල ඇඳුම - කාන්තා (නිලධාරිනියන් සහ සෙසුනිලයන්)





| අනු අංකය | අයිතමය | විස්තරය | විශේෂ කරුණු |
|---|---|---|---|
| 01 | සාරිය | ලා පැහැති සාරියක් | සුදුසු පරිදි |
| 02 | හිස් පළඳනාව | සේවාවන්ට ආවේනික හිස් වැසුම | **යුද්ධ හමුදාව**: කර්නල් සහ ඉන් ඉහළ එම්බ්‍රොයිඩර් සහ ලුතිනන් කර්නල් සහ ඉන් පහළ නිලයන් සඳහා රෙජිමේන්තුවට ආවේනික සිරස්ක ලාංඡනය.<br>**නාවික හමුදාව**: ආවේනික සිරස්ක ලාංඡනය සමග කළු/නිල් වර්ණයෙන් යුත් හිස් වැසුම් පැළඳිම.<br>**ගුවන් හමුදාව**: ආවේනික සිරස්ක ලාංඡනය සමග හිස් වැසුම් පැළඳීම. |
| 03 | සපත්තු | සාරියට සහ අවස්ථාවන්ට සුදුසු පරිදි | සාරියට ගැලපෙන පරිදි. |
| 04 | තරු | සේවාවන්ට අවේනික රත්‍රං/ රිදී පැහැති වර්ණයෙන් යුත් තරු (තරුවක උස 1.5 සෙ.මී පළල 1.5 සෙ.මී.) | ත්‍රිවිධ හමුදා ධජ නිලධාරිනීන් (Tri Service Ranks Brigadier and above) කබාය/සිවිල්කබා යෙහි වම්පස (Lapel) මත. |
| 05 | පදක්කම් | අනුමත පදක්කම් (පපුවෙහි වම් පස) | පදක්කම් හිමි විශ්‍රාමික නිලධාරිනියක /සෙසුනිලයකු මියයාමෙන් පසුව ඇයට හිමි ගන්වා ඇති පදක්කම් ඇයගේ ළගම ඥාතියා/ දරුවන් හට පපුවේ වම් පස පැළඳීමට හැකියාව ඇත (දැනට සේවයේ නියතු වුවන් හට මෙයට හිමිකම් නොමැත). |



| | | | |
|---|---|---|---|
| 06 | ලාංඡන | අනුමත සහ සුදුසුකම් ලද ලාංඡන | කබායේ දකුණුපස (Lapel) මත අදාළ සේවාවේ ජ්‍යේෂ්ඨතාවය අනුව. |

